සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 10 - 2023

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකය:

සැ.යු. :-

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ඇති (1), (2). (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අකුරෙන් ඔබ තෝරා ගත් අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. සන්නිවේදනය පිළිබඳ ගණිතමය ආකෘතිය හඳුන්වා දෙන ලද්දේ,
    (1) විල්බර් ශ්‍රාම් විසිනි. (2) ඩේවිඩ් කේ බර්ලෝ විසිනි.
    (3) ඕස්ගුඩ් සහ ශ්‍රාම් විසිනි. (4) ෂැනෝන් හා වීවර් විසිනි.

02. සන්නිවේදන ක්‍රියාවලියේ මූලික අංග කිහිපයක් ලෙස සැලකිය හැකි වන්නේ,
    (1) ඝෝෂා, සන්දර්භය, විකාශනය හා ප්‍රතිපෝෂණයයි.
    (2) සන්නිවේදකයා, දොරටුපාලකයා, විචාරකයා හා ග්‍රාහකයායි.
    (3) බලපෑම, ග්‍රාහකයා, පණිවිඩය, නිවේදකයායි.
    (4) ග්‍රාහකයා, පණිවිඩය, බලපෑම, මාධ්‍යයයි.

03. පණිවිඩයකට අර්ථය ලබා දෙන ප්‍රධානතම තැනැත්තා වන්නේ,
    (1) සන්නිවේදකයා ය. (2) ග්‍රාහකයා ය. (3) දොරටුපාලකයා ය. (4) විචාරකයා ය.

04. ලේඛනයක් ඡායාපිටපත් කිරීමේ දී තීන්ත තැවරීම නිසා එහි සඳහන් දෑ කියවා ගත නොහැකි විය. මෙය,
    (1) මාධ්‍ය බාධකයකි. (2) අර්ථ බාධකයකි. (3) දෘශ්‍ය බාධකයකි. (4) යාන්ත්‍රික බාධකයකි.

05. ආයතනයක් තුළ යෝජනා පෙට්ටියක් පවත්වාගෙන යාම,
    (1) අවිධිමත් මෙන්ම ඉහළ සිට පහළට සන්නිවේදනය සිදු කරන අවස්ථාවක් වේ.
    (2) විධිමත් මෙන්ම හරස් සන්නිවේදනයක් සිදු කරන අවස්ථාවක් වේ.
    (3) අවිධිමත් මෙන්ම පහළ සිට ඉහළට සන්නිවේදනය කරන අවස්ථාවක් වේ.
    (4) විධිමත් මෙන්ම පහළ සිට ඉහළට සන්නිවේදනය කරන අවස්ථාවක් වේ.

06. නිල ලිපි ශීර්ෂයක් සහිත ලිපියක් ඒ ආකාරයෙන්ම ඉක්මනින් හා පහසුවෙන් තවත් ස්ථානයක් වෙත යැවිය හැකි වන්නේ,
    (1) විද්‍යුත් තැපැල මගිනි. (2) ෆැක්ස් යන්ත්‍රය මගිනි.
    (3) ඩිජිටල් කැමරාවක් මගිනි. (4) ඡායාපිටපත් යන්ත්‍රයක් මගිනි.

07. කාර්යාලීය මාධ්‍ය උපකරණ අතර යල් පැන යමින් ඇත්තේ,
    (1) ස්කෑන් යන්ත්‍රයයි. (2) විද්‍යුත් යතුරු ලියනයයි. (3) ඡායා පිටපත් යන්ත්‍රයයි. (4) දුරකථනයයි.

08. අන්තර් පුද්ගල සන්නිවේදනය මගින්,
    (1) තමාට තමා ගැන අවබෝධයක් ලබා දෙයි.
    (2) අනුන් තමන් ගැන සිතන අයුරු දැනගත හැකිය.
    (3) දක්ෂ කථිකයෙකු වීමට ක්‍රමයෙන් මඟ පෑදෙයි.
    (4) විශාල පිරිසක් සමඟ තොරතුරු හුවමාරු කරගත හැකිවෙයි.

09. ග්‍රාහකයා යනු,

(1) පණිවිඩය ඉදිරිපත් කරනු ලබන්නා ය. (2) මාධ්‍යය සඳහා සංදේශය සකස් කරනු ලබන්නා ය.

(3) සන්නිවේදන ක්‍රියාවලියේ ආරම්භකයා ය. (4) පණිවිඩය ලබා ගන්නා පුද්ගලයා ය.

10. අන්තර්පුද්ගල සන්නිවේදන අවස්ථාවක් වන්නේ,

(1) මවක් දරු දැරියන් පිරිසකට කතාවක් කියා දීම ය. (2) ගුරුතුමා පන්ති කාමරයේ පාඩමක් කියා දීම ය.

(3) මව සහ පියා එකිනෙකා හා කතා බහ කිරීම ය. (4) ශිෂ්‍යයා පාසල් පෙළපොත ශබ්ද නගා කියවීම ය.

11. උත්තේජන - ප්‍රතිචාර ක්‍රියාවලියට වඩාත් අදාල වන්නේ,

(1) ඇස, කන, දිව, නාසය හා ශරීරය යි. (2) මුහුණ, කට, අත්, පාද හා හිස යි.

(3) මොළය, ඇස, කන, නාසය හා ශරීරය යි. (4) ගඳ, සුවඳ, රස, තිත්ත හා ශබ්දය යි.

12. අප සතුව පවතින සහතික පත්‍ර දිගු කලක් සුරක්ෂිත ව තබා ගැනීමට අවශ්‍ය විය. ඒ සඳහා භාවිතා කළ හැකි වඩාත් යෝග්‍ය ක්‍රමවේදය වන්නේ,

(1) සහතික වල ඡායාපිටපත් කිහිපයක් ලබා ගැනීමයි.

(2) කඩදාසි ලිපි කවරයක බහා සීල් තැබීමයි.

(3) පොලිතින් ආවරණයක් යොදා ලැමිනේට් කිරීමයි.

(4) ඩිජිටල් කැමරාවෙන් ඡායාරූප ගත කිරීමයි.

13. අක්ෂි සම්බන්ධතාව යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

(1) රූපවාහිනිය නැරඹීමේ දී ඒ දෙසට ඇස් යොමු කිරීමයි.

(2) කෙනෙක් සමග කතා කිරීමේ දී ඒ පුද්ගලයා දෙසට ඇස් යොමු කිරීමයි.

(3) පොතක් කියවීමේ දී සිදුවන අක්ෂි වල ක්‍රියාකාරිත්වය යි.

(4) අක්ෂි දෝෂවලට ගැලපෙන ලෙස උපැස් යුවලක් පැළඳවීමයි.

14. අධිවේගී මාර්ග වල රථවාහන ගමනා ගමනය පිළිබඳ නිරීක්ෂණ කටයුතු සිදු කරනු ලබන්නේ,

(1) චන්ද්‍රිකා තාක්ෂණය උපයෝගී කර ගනිමිනි. (2) ජංගම දුරකථන පණිවිඩ හුවමාරුව මගිනි.

(3) සංවෘත පරිපථ රූපවාහිනි කැමරා මගිනි. (4) රථවාහන පොලිසියේ ජංගම සංචාර මගිනි.

15. අවිධිමත් සන්නිවේදන අවස්ථා වන්නේ,

(1) කටකතා, කේලාම් හා ඕපාදූප ය. (2) පත්තර, කටකතා හා නිර්නාමික ලිපිය

(3) කැලෑ පත්තර, සංගීත ප්‍රදර්ශන, ඕපාදූප (4) උද්ඝෝෂණ, ලිපි හා කේලාම් ය.

16. ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය හිමිකාරිත්වය පිළිබඳ ප්‍රධාන වර්ගීකරණය වන්නේ,

(1) සමාගම් මාධ්‍ය හා පවුල් මාධ්‍යය යි. (2) රාජ්‍ය මාධ්‍ය හා මහජන සේවා මාධ්‍යය යි.

(3) රාජ්‍ය මාධ්‍ය හා පෞද්ගලික මාධ්‍යය යි. (4) වානිජ මාධ්‍යය හා රාජ්‍ය මාධ්‍යය යි.

17. පුවත් පත් ආයතනික ව්‍යුහයක ප්‍රධාන අංශ වන්නේ,

(1) පාලන අංශය, දැන්වීම් අංශය, කර්තෘ මණ්ඩලය, මුද්‍රණ හා බෙදා හැරීම් අංශය යි.

(2) කර්තෘ මණ්ඩලය, ලේඛක මණ්ඩලය, දැන්වීම් අංශය හා බෙදා හැරීමේ අංශය යි.

(3) අධ්‍යක්ෂක මණ්ඩලය, කර්තෘ මණ්ඩලය, මුද්‍රණ අංශය හා අලෙවි ප්‍රවර්ධන අංශය යි.

(4) දැන්වීම් අංශය, පිටු සැකසුම් අංශය, සෝදුපත් අංශය හා මුද්‍රණ අංශය යි.

18. පුවත්පතක ප්‍රධාන සංස්කාරක භූමිකාව හා නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.

(1) ප්‍රවෘත්ති වාර්තාකරණයේ නියැලීම. (2) සංස්කාරක වැකිය රචනා කිරීම.

(3) ප්‍රවෘත්ති සංස්කාරකට උපදෙස් දීම. (4) මුල් පිටුවේ ප්‍රධාන ඡායාරූපය තේරීම.

19. අන්තර් පුද්ගල සන්නිවේදනය බොහෝ විට,

(1) ශ්‍රව්‍ය හා කථන සන්නිවේදනයේ එකතුවකි. (2) වාචික හා නිර්වාචික සන්නිවේදනයේ එකතුවකි.
(3) දෘශ්‍ය හා වාචික සන්නිවේදනයේ එකතුවකි. (4) විධිමත් හා අවිධිමත් සන්නිවේදනයේ එකතුවකි.

20. ජනමාධ්‍ය ආයතනයක ප්‍රතිපත්ති සකස් කරනු ලබන්නේ,

(1) ග්‍රාහකයින් (2) ජනමාධ්‍යවේදීන් (3) දැන්වීම්කරුවන් (4) හිමිකරුවන්

21. දේශනයක් පවත්වන අතරතුර කිසියම් පොතක ඇතුළත් රූපසටහනක් පෙර සූදානමකින් තොරව ශ්‍රාවක පිරිස වෙත ඉදිරිපත් කිරීමට ඔබට අවශ්‍ය වෙයි. ඊට ඔබ තෝරා ගන්නේ,

(1) ක්ෂනික ප්‍රක්ෂේපණ යන්ත්‍රය යි. (2) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය යි.
(3) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය යි. (4) ස්ලයිඩ් ප්‍රක්ෂේපණ යන්ත්‍රය යි.

22. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) කථන සන්නිවේදනය නිර්වාචික විය හැකිය.
(2) වාචික සන්නිවේදනය කථනය මගින් සිදු කළ නොහැකිය.
(3) නිර්වාචික සන්නිවේදනය සඳහා හඬ භාවිත කළ හැකිය.
(4) ලිඛිත සන්නිවේදනය වාචික හෝ නිර්වාචික විය හැකියි.

23. හෙට දිනය ගත කරන ආකාරය කල්පනා කළ නීතා උදෑසන පුස්තකාලයට ගොස් හවස සිය මිතුරියන් සමග සිනමාපටයක් නැරඹීමට යාමට තීරණය කළාය. එම තීරණය,

(1) කණ්ඩායම් සන්නිවේදන අවස්ථාවකි. (2) පුද්ගලාන්තර සන්නිවේදන අවස්ථාවකි.
(3) ජන සන්නිවේදන අවස්ථාවකි. (4) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදන අවස්ථාවකි.

24. පහත විධික්‍රම අතුරෙන් පුද්ගලාන්තර සන්නිවේදනයට ඇතුලත් නොවීමට ඉඩ ඇත්තේ කුමක් ද?

(1) ලිපියක් යැවීම (2) විද්‍යුත් තැපැල් ගිණුමක් ඇරඹීම
(3) අතට අත දීම (4) කෙටි පණිවිඩයක් යැවීම

25. පිරිසක් වෙත තොරතුරු ඉදිරිපත් කිරීමේ දී අවම කාලයක් තුළ භාවිතයට යොදා ගත හැකි වන්නේ,

(1) විනිවිදක ප්‍රක්ෂේපණ යන්ත්‍රය යි. (2) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය යි.
(3) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය යි. (4) සිනමා ප්‍රක්ෂේපණ යන්ත්‍රය යි.

26. කණ්ඩායම් සන්නිවේදනය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) නායකයෙක් සිටීමට ඉඩ ඇත. (2) පොදු අරමුණක් තිබීම වැදගත් වේ.
(3) අවම හෝ උපරිම සාමාජික සංඛ්‍යාවක් නොමැත. (4) මුහුණට මුහුණලා සිටීම අනවශ්‍යයයි.

27. මානවයා භාවිතා කරන ප්‍රාථමික සන්නිවේදන ක්‍රමයකි

(1) පුවත්පත (2) දැන්වීම් පුවරුව (3) සමාජ ජාල (4) නලා නාදයයි

28. බලධාරියෙකුගේ අත්සන යෙදීම උදෙසා නිත්‍යානුකූලභාවය ලබා දෙන මාධ්‍ය උපකරණය වන්නේ,

(1) ගණක යන්ත්‍රය (2) නිල මුද්‍රාව (3) දින මුද්‍රාව (4) තැපැල් මුද්‍රාව

29. පැරණි මුද්‍රණ ක්‍රමයට හා නූතන මුද්‍රණ ක්‍රමයට දොරටු විවර කළ රටවල් වන්නේ,

(1) ඇමරිකාව හා ඉන්දියාව (2) ඇමරිකාව හා බ්‍රිතාන්‍යය
(3) චීනය හා ජපානය (4) චීනය හා ජර්මනියි

30. කෙනෙකුගේ පංචේන්ද්‍රිය මගින් ලැබෙන සංදේශ ග්‍රහණය කරගෙන එය තේරුම් ගැනීම,

(1) සහවේදනයයි. (2) සහජ හැකියාවයි. (3) විසම්මුතියයි. (4) සංජානනයයි.

31. බසයක් පැමිණෙන තුරු බස්නැවතුම් පලක රැඳී සිටින මගින් පිරිසක් අතර ඇති වන සන්නිවේදනය,

(1) අන්තර් පුද්ගල සන්නිවේදනය යි. (2) විධිමත් සන්නිවේදනය යි.

(3) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය යි. (4) අවිධිමත් සන්නිවේදනය යි.

32. අන්තර්ජාලය භාවිත කරමින් තිදෙනෙකු සම්බන්ධ වී සිදු කරන සම්මන්ත්‍රණ දුරකථන සංවාදයක්

(1) ජනසන්නිවේදන අවස්ථාවකි. (2) සමූහ සන්නිවේදනයකි.

(3) අන්තර්පුද්ගල සන්නිවේදනයකි. (4) සමාජ ජාලයකි.

33. අන්තර්පුද්ගල සන්නිවේදනයේ විශේෂත්වය වන්නේ,

(1) ජනමාධ්‍ය භාවිතයට උපයෝගී වීමයි.

(2) තමා තුළම පවත්නා සන්නිවේදනයක් වීමයි.

(3) කුඩා පිරිසක් සමග සම්බන්ධ වීමයි.

(4) ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය වේගවත් වීමයි.

34. විද්‍යුත් මාධ්‍ය වෙත ග්‍රාහක ප්‍රතිචාර කඩිනමින් ලබා දීමට හැකි ක්‍රමවේද වන්නේ,

(1) ලිපි හා විද්‍යුත් තැපැල (2) තැපැල් හා කෙටි පණිවිඩ

(3) ලිපි හා සමාජ ජාල (4) කෙටි පණිවිඩ හා සමාජ ජාල

35. දකුණේ සිට වමට ලේඛණයේ යෙදෙන භාෂාව වන්නේ,

(1) හින්දි භාෂාවයි. (2) ජපන් භාෂාවයි. (3) අරාබි භාෂාවයි. (4) කොරියන් භාෂාවයි.

36. මාධ්‍යයෙහි ''අභිසාරිතාව'' යන්නට ගැලපෙන ප්‍රකාශය තෝරන්න.

(1) විවිධ මාධ්‍ය ආයතන ජාලගත වූ අවස්ථාවකි.

(2) භූගෝලීය සීමාවන් ඉක්මවා යන්නකි.

(3) ඕනෑම වෙබ් අඩවියකට පහසුවෙන් ප්‍රවේශ වීමට ඇති හැකියාවයි.

(4) සියලු ජනමාධ්‍ය එක්තැන් වූ නව මාධ්‍ය භාවිතයකි.

37. පන්සලේ වාර්ෂික වස් පිංකම පිළිබඳව ගම්වැසියන් දැනුවත් කිරීම සඳහා වඩාත් සුදුසු සමූහ සන්නිවේදන ක්‍රමය වන්නේ,

(1) පෞද්ගලික ලිපි මගින් දැනුම් දීමයි. (2) දිනපතා පුවත් පතක දැන්වීමක් පල කිරීමයි.

(3) ගෙන් ගෙට ගොස් අත් පත්‍රිකා බෙදා හැරීමයි. (4) ජංගම ශබ්ද විකාශන රථයක් යොදා ගැනීමයි.

38. අවාචික සන්නිවේදනයට නිදසුනක් වන්නේ,

(1) ගීතයක් ගායනා කිරීමයි. (2) ධර්ම දේශනාවක් පැවැත්වීමයි.

(3) පුවත් පතක ශීර්ෂ පාඨයයි. (4) හෝඩියක අකුරු කියවීමයි.

39. එක් අයෙකු කේන්ද්‍ර කොටගෙන වැඩි දෙනෙක් වෙත පණිවිඩය පැතිර යන විධිමත් සන්න්වේදන ආකෘතිය වන්නේ කුමක් ද?

(1) චක්‍රිය (2) රෝද (3) වයි (4) දාම

40. පරිගණකය ආධාරයෙන් තොරව පංතිකාමරය තුල දී භාවිතයට ගත හැකි ප්‍රක්ෂේපණ මාධ්‍ය උපකරණයක් වන්නේ,

(1) අන්තර් ක්‍රියාකාරි පුවරුව (2) බහුමාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍රය

(3) පිටු පෙරළනය (4) ක්ෂණික ප්‍රක්ෂේපන යන්ත්‍රය

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 10 - 2023

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

වැදගත්:-

- පළමු ප්‍රශ්නය හා තෝරා ගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමි වන අතර, අනකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) සුමිත් පුවත්පත් ආයතනයක වාර්තා කරුවෙකි.

(i) සුමිත් සම්බන්ධ වී සිටින්නේ කුමන සන්නිවේදන වර්ගයට ද?

(ii) ඉහත සන්නිවේදන වර්ගයට අයත් ලක්ෂණ 02 ක් නම් කරන්න.

(iii) රාජ්‍ය හිමිකාරිත්වය යටතේ තිබෙන පුවත්පත් ආයතනය කුමක් ද?

(iv) පුවත්පත් ආයතනයේ මුද්‍රන වැඩ කටයුතු පහසු කර ගැනීමට භාවිතා කළ හැකි ක්‍රමවේදය කුමක් ද?

(v) එම ක්‍රමවේදයේ වාසි දෙකක් සඳහන් කරන්න.

(vi) සුමිත්ගේ පුවත්පත් ආයතනය තුළ තිබිය හැකි යැයි උපකල්පනය කළ හැකි කාර්යාලීය මාධ්‍ය උපකරණ 02 ක් නම් කරන්න.

(vii) ශ්‍රී ලංකාවේ ප්‍රථම පුවත්පත නම් කරන්න.

(viii) පුවත්පත් ආයතනයක ප්‍රධාන අංග 02 ක් නම් කරන්න.

(ix) ආයතනයකට සම්බන්ධ මාධ්‍යවේදීන් බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

(x) වර්තමාන මාධ්‍ය ප්‍රමාණතාවක් ලෙස සියලු ජනමාධ්‍යයක් එකම තලයක දී හමු වේ. මෙම සංකල්පය හැඳින්වීමට භාවිතා කරන යෙදුම කුමක් ද? (ල. 2 x 10 = 20)

02. (i) ප්‍රාථමික සන්නිවේදන ක්‍රම 02 ක් නම් කරන්න. (ල. 01)

(ii) ලැස්වේල් ආකෘතිය ඇඳ දක්වා, එම ආකෘතියේ ඇති සුවිශේෂී අංගය නම් කරන්න. (ල. 1 x 2 = 02)

(iii) සන්නිවේදන මූලිකාංග 03 ක් පැහැදිලි කරන්න. (ල. 1 x 3 = 03)

(iv) සන්නිවේදනයේ මූලික කාර්යයන් 04 ක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. ( ල. 1 x 4 = ල. 04)

03. (i) සංජානනය යනු කුමක් ද? (ල. 01)

(ii) සංජානනයට බාධා පමුණුවන හේතු 02 ක් නම් කරන්න. (ල. 02)

(iii) අන්තර්වර්තී සන්නිවේදනයේ පහත ලක්ෂණ පැහැදිලි කරන්න.

(අ) ආත්ම භාෂණයට ප්‍රමුඛත්වය ලැබීම.

(ආ) සිතිවිලි හා හැඟීම් මත සන්නිවේදනය සිදුවීම.

(ඉ) පුද්ගල තීරණ ගැනීමේ කාර්යය සිදුවීම. (ල. 03)

(iv) සන්නිවේදනයේ ප්‍රධාන බාධක වර්ග දෙක උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 04)

04. (i) වර්තමාන ව්‍යවහාරයේ පවතින CCTV යන කෙටි යෙදුම හඳුන්වන සිංහල නම ලියා දක්වන්න. (ල. 01)

(ii) ආයතනයකට වෙබ් අඩවියක් නිර්මාණය කර ගැනීමේ වාසි 02 ක් නම් කරන්න. (ල. 02)

(iii) දුරකථන භාවිතයේ දී දෙපාර්ශවයම පිළිපැදිය යුතු ආචාරධර්ම රාශියකි. එවායින් ආචාරධර්ම 03 ක් පැහැදිලි කරන්න. (ල. 03)

(iv) පංති කාමර මාධ්‍ය උපකරණ භාවිතා කිරීමේ ඇති වාසි 04 ක් පැහැදිලි කරන්න. (ල. 04)

05. (i) ශ්‍රී ලංකාවේ ප්‍රථම සිංහල මාධ්‍ය පුවත්පත කුමක් ද? (ල. 01)

(ii) ශ්‍රී ලංකා ඉතිහාසය තුළ ආරම්භ කරන ලද පෞද්ගලික ව්‍යාපාර හිමි පුවත්පත් ආයතන 02 ක් නම් කරන්න. (ල. 02)

(iii) ගුවන් විදුලි ආයතනයක ප්‍රධාන අංශ 03 ක් පැහැදිලි කරන්න. (ල. 1 x 3 = 03)

(iv) මුද්‍රණ ක්‍රියාවලියක පහත සඳහන් පියවරයන් පැහැදිලි කරන්න.

(අ) අත් පිටපත සැකසීම.

(ආ) අකුරු යෝජනය හා පිටු සැලසුම් කිරීම.

(ඇ) මුද්‍රණය හා පිටපත්කරණය

(ඉ) නිමි කටයුතු (ල. 1 x 4 = 04)

06. (i) මාධ්‍ය ආයතනයක සර්ව සංවිධාන සටහනක් ඇඳ දක්වන්න. (ල. 01)

(ii) පුවත්පතක දැන්වීම් වල මිල තීරණය කරන සාධක 02 ක් නම් කරන්න. (ල. 1 x 2 = 02)

(iii) ඵලදායි ලේඛනයක ලක්ෂණ 03 ක් පැහැදිලි කරන්න. (ල. 1 x 3 = 03)

(iv) ප්‍රක්ෂේපණීය මාධ්‍ය උපකරණ දෙකක හා ප්‍රක්ෂේපණීය නොවන මාධ්‍ය උපකරණ දෙකක ක්‍රියාකාරිත්වය පැහැදිලි කරන්න. (ල. 04)

07. (i) කිසියම් භාෂාවක් වාචික හා ලිඛිත ලෙස පැවතීම හඳුන්වන නම කුමක් ද? (ල. 01)

(ii) වාචික භාෂාවට වඩා ලිඛිත භාෂාව විධිමත් වීමට බලපාන කරුණු 02 ක් ලියන්න. (ල. 1 x 2 = 02)

(iii) වාචික සන්නිවේදනයේ සාර්ථකත්වය සඳහා බලපාන භාෂා කුසලතා 03 ක් පැහැදිලි කරන්න.

(ල. 1 x 3 = 03)

(iv) ජනමාධ්‍ය මගින් සමාජයට සිදුවන බලපෑම වර්තමානයේ දැඩි වී ඇත. පහත සඳහන් බලපෑම් විස්තර කරන්න.

(අ) දෛනික ජීවිතය වෙනස් කිරීම.

(ආ) රස වින්දනය වෙනස් වීම.

(ඉ) පරිභෝජන රටාව වෙනස් කිරීම.

(ඊ) විවිධ චර්යා ඇති කිරීමට පෙළඹවීම. (ල. 1 x 4 = 04)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(4) | 3 -(2) | 4 -(1) | 5 -(4) | 6 -(2) | 7 -(2) | 8 -(2) | 9 -(4) | 10 -(3) |
| 11-(1) | 12 -(3) | 13 -(2) | 14 -(3) | 15 -(1) | 16 -(3) | 17 -(4) | 18 -(1) | 19 -(2) | 20 -(4) |
| 21-(1) | 22 -(2) | 23 -(4) | 24 -(2) | 25 -(2) | 26 -(3) | 27 -(4) | 28 -(2) | 29 -(4) | 30 -(4) |
| 31-(4) | 32 -(3) | 33 -(4) | 34 -(4) | 35 -(3) | 36 -(4) | 37 -(4) | 38 -(4) | 39 -(2) | 40 -(4) |

(එක් ප්‍රශ්නයකට ලකුණු 1 බැගින් ප්‍රශ්න 40 ට ලකුණු 40 ක් හිමිවේ.)

## II පත්‍රය

01. ලකුණු ලබා දීමේ පටිපාටිය (i) පත්‍රය සඳහා 1 x 40 = 40

(ii) පත්‍රය සඳහා පළමු ප්‍රශ්නයට 2 x 10 = 20

තෝරාගත් ප්‍රශ්න 4 සඳහා 10 x 04 = 40 60

100

(i) ජන සන්නිවේදනයට

(ii)
- සංදේශය පොදුය
- සන්නිවේදකයා හා ග්‍රාහකයා අභිමුඛ නොවේ
- සංවිධිත ආයතනයක් මගින් ක්‍රියාත්මක වේ
- වෘත්තිය සන්නිවේදකයන් කටයුතු කරයි
- මූලික වශයෙන් ඒක මාර්ගික වේ. ආදී ලෙස

(iii) ලේක්හවුස් ආයතනය / එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

(iv) DTP ක්‍රියාවලිය / පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලිය

(v) අඩු පිරිවැය / ආකර්ශනීය නිමාව / ඉකමන් බව / පහසුව / කාර්යක්ෂමතාව

(vi) දින මුද්‍රාව / නිල මුද්‍රාව / පරිගණකය / ගණක යන්ත්‍රය

(vii) කලම්බු ජ'ර්නල්

(viii) ප්‍රවෘත්ති අංශය / සංස්කරණ අංශය / විශේෂාංග අංශය / ඡායාරූප අංශය / දැන්වීම් අංශය

(ix) • මාණ්ඩලික මාධ්‍යවේදීන් • ප්‍රාදේශීය මාධ්‍යවේදීන්

(x) මාධ්‍ය අභිසාරිතාව / මාධ්‍ය අභිසරණතාව ( ල. 2 x 10 = ල. 20)

02. (i) ගිනිමැලය, දුම, හූව, කොළ අතු එල්ලීම, බෙරය, නලාව ( ල. 1/2 x 2 = ල. 01)

(ii) සන්නිවේදකයා ⟶ සංදේශය ⟶ මාධ්‍ය ⟶ ග්‍රාහකයා ⟶ බලපෑම ( ල. 01)
බලපෑම (ල. 01)

(iii) සන්නිවේදකයා / සංදේශය / මාධ්‍ය / ග්‍රාහකයා / බලපෑම / බාධක (පිළිබඳ ප්‍රමාණාත්මක පැහැදිලි කිරීමකට 1 x 3 = ල. 03)

(iv) තොරතුරු සැපයීම / අධ්‍යාපනය ලබා දීම / විනෝදාස්වාදය ලබා දීම / පෙළඹවීම / සමාජානුයෝජනය / සංවාද සාකච්ඡා ආදිය
නිදසුන් සහිත නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න ( ල. 1 x 4 = ල. 04)

03. (i) පංචේන්ද්‍රිය මගින් ලැබෙන විවිධ සංදේශ ග්‍රහණය කරගෙන එය තේරුම් හැගීමයි. (ල. 01)

(ii)
- සංදේශ තුළ විවිධාර්ථ තිබීම
- වැරදි ලෙස තොරතුරු ගොනු කර සංදේශය සැකසීම
- සංදේශයේ තොරතුරු විකෘති වී තිබීම
- ග්‍රාහකයාගේ අත්දැකීම් පසුතලයට නොගැලපීම ( ල. 1 x 2 = ල. 02)

(iii) අදාළ කරුණු නිවැරදි ලෙස පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. ( ල. 1 x 3 = ල. 03)

(iv) • අර්ථ බාධක • මාධ්‍ය බාධක
මේවා උදාහරණ සහිතව පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. ( ල. 2 x 2 = ල. 04)

**පිළිතුරු පත්‍රය - II කොටස - ඉතිරි කොටස**

04. (i) සංවෘත පරිපථ රූපවාහිනි කැමරා (ල. 01)

(ii) ● කාර්යාලයේ තොරතුරු වහාම ලෝකය පුරා ඕනෑම කෙනෙකුට ග්‍රහණය කර ගත හැකි වීම. ● කාර්යාලයේ තොරතුරු යාවත්කාලීන කිරීම ● කාර්යාලයේ කාර්යයන් සමාජයට විවෘත කිරීම. ● කාර්යාලයේ කටයුතු වඩාත් විධිමත්ව හා පිළිවෙලකට කළ හැකි වීම. ● කාර්යාලයේ තොරතුරු වේගවත්ව නිකුත් කළ හැකි වීම. ● විවිධ ප්‍රතිචාර ක්ෂණිකව ලබා ගත හැකි වීම.(ල. 02)

(iii)
- දෙපාර්ශවයේම ගෞරවය රැකෙන පරිදි වචන භාවිතා කළ යුතුය
- කිව යුතු දේ කෙටියෙන් ප්‍රකාශ කළ යුතුය
- තමන්ට දුරකථනයෙන් විසදා ගත නොහැකි ප්‍රශ්න සඳහා දුරකතනය භාවිතා නොකිරීම
- තමන් නොදන්නා අයගේ කෙටි පණිවිඩ වලට පිලිතුරු දීමෙන් වලකින්න. ආදී නිවැරදි කරුණු 03 ක් විස්තර කර ඇත්නම් (1 x 3 = ල. 03)

(iv) ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පහසු කිරීම
ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ඵලදායිතාවය ඉහළ නැංවීම
ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආකර්ශනය කර ගැනීමට මතක තබා ගැනීමට..... (ල. 1 x 4 = 04)

05. (i) ලංකා ලෝකය (ල. 01)

(ii)
- D.R. විජේවර්ධන - ලේක් හවුස් ආයතනය. (ල. 1 x 3 = 03)
- M. D. ගුණසේන - දවස / ස්වාධීන පුවත්පත් ආයතනය.
- උපාලි විජේවර්ධන - උපාලි පුවත්පත් සමාගම (ල. 02)

(iii) ප්‍රවෘත්ති අංශය
වැඩ සටහන් අංශය
තාක්ෂණික අංශය
දැක්වීම් අංශය
} 10 ශ්‍රේණිය පෙළ පොත 102 පිටුව

(iv) 10 ශ්‍රේණිය - පෙළ පොත - 64 පිටුව (ල. 1 x 4 = 04)

06. (i) සභාපති
↓
අධ්‍යක්ෂ මන්ඩලය
↓
ප්‍රධාන විධායක
↓
මාධ්‍යවේදීන්
↓
මහජනයා (ල. 01)

(ii) පිටුව / වර්ණ / ප්‍රමාණය / වර්ගය (ල. 1 x 2 = 02)

(iii)
- නිරවුල් බව හා පැහැදිලි බව
- ලේඛනයට උචිත ආකෘතිය හා නිර්මාණශීලී බව
- සම්මත ව්‍යාකරණ විධි භාවිතය (ල. 1 x 3 = 03)

(iv)

| ප්‍රක්ෂේපණය මාධ්‍ය උපකරණ | ප්‍රක්ෂේපණය නොවන මාධ්‍ය |
|---|---|
| ● ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය | කළු ලෑල්ල |
| ● කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය | සුදු ලෑල්ල |
| ● ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය | කාන්දම් ලෑල්ල |
| ● බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය | පත්‍රිකා ලෑල්ල |
| ● අන්තර් ක්‍රියාකාරි පුවරුව | පිටු පෙරළනය |

(නිවැරදි ලෙස ක්‍රියකාරීමය / පරිහරණය කිරීම දක්වා තිබේ නම් 1 x 4 = 04)

**පිළිතුරු පත්‍රය - II කොටස - ඉතිරි කොටස**

07. (i) ද්විරූපිතාව (භාෂාවක) (ල. 01)

(ii)
- එහි ව්‍යාකරන තිබීම
- අක්ෂර වින්‍යාසය තිබීම
- අකුරු වලට හැඩයක් තිබීම
- විරාම ලක්ෂණ යෙදීම
- වචන ඇත් කර ලිවීම
- එක් වාක්‍යයකින් තවත් වාක්‍යයක් වෙන් කර දක්ව ලිවීම
- එක් ඡේදයකින් තවත් ඡේදයක් තවත් කර දක්වා තිබීම (ල. 1 x 2 = 02)

(iii)
- උච්චාරණය
- අර්ථ ගැන්වීම
- යෝග්‍යතාව

ප්‍රමාණවත් පරිදි නිවැරදි ලෙස පැහැදිලි කර තිබේ නම් (ල. 1 x 3 = 03)

(iv)
(අ) දෛනික ජීවිතය වෙනස් කිරීම - ජනමාධ්‍ය න්‍යාය පත්‍රයට අනුගත වීම
(ආ) රස වින්දනය වෙනස් වීම - බාල පහත් හර සුන් වැඩසටහන් වලට වැඩි කැමැත්තක් දැක්වීම
(ඉ) පරිභෝජන රටාව වෙනස්වීම - ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයන්ට වඩා ජනප්‍රිය අංගයන්ට පරිහරණයට යොමු වීම. (ආහාර පාන)
(ඊ) විවිධ චර්යා රටා ඇති වීම - වෙනත් සංස්කෘතීන් වල පිරිත් විරිත් වලට යොමු වීම.
(ල. 1 x 4 = 04)